අකුරැස්ස ප්‍රාදේශීය සභාව,
මාතර දිස්ත්‍රික්කය.
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 09 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත වියදම් රු.2,171,060 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.110,846 ක්වූ පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.14,247,728 ක වියදම සහ අක්කර 05 ක්වූ එම ඉඩමෙහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල සංවර්ධනය සඳහා වැයකරන ලද රු.848,193 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ඉකුත් වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.5,239,207 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලා ඇති අතර එය ලද වහාම ගිණුම් ගැලපීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 116,348,398 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.57,871,088 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ශේෂ හා උපයෝගී ලේඛන ශේෂයන් අතර වෙනසට හේතු හඳුනාගෙන ඒවා ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.188,113,605 ක්වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කිරීම සහ වර්ෂ 10ක් දක්වා ආපසු ලේඛන පරීක්ෂා කළද, නිශ්චිතව තහවුරු කර ගැනීමක් සිදු කළ නොහැකි ගිණුම් විෂයයන් ඇත. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 703 (1) (ආ) | සභා කාර්යාල පරිශ්‍රයේ රථවාහන අංගනය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කාර සමිතිය විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කිසිදු අවස්ථාවක දී උප **කොන්ත්‍රාත්කරුවෙකු** වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සභාවේ අනුමැතිය ලබාදී නොමැත. |
| (ඇ) රාජ්‍ය මුදල් 01 2012 හා 2012 ජනවාරි 05 දිනැති චක්‍රලේඛය | ප්‍රජාපාදක සංවිධානවලට වැඩ කොන්ත්‍රාත් පැවරීමේ යෝග්‍යතාව පරීක්ෂා කිරීමකින් තොරව කර්මාන්තය ඉටුකිරීම සඳහා සමිති වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනුමත හා සක්‍රීය මට්ටමේ පවතින ලියාපදිංචි සමිති නාම ලේඛනය ගෙන්වාගෙන එම ප්‍රජාපාදක සංවිධානවලට පමණක් වැඩ / හා කොන්ත්‍රාත් පිරිනැමීමට 2020 වර්ෂයේ සිට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,357,501 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,940,635 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,092,000 | 3,802,843 | 4,132,592 | 1,226,921 | 2,012,000 | 2,168,357 | 1,990,568 | 1,556,670 |
| කුලී | 5,920,550 | 4,585,811 | 4,862,529 | 7,060,819 | 3,600,000 | 3,363,845 | 2,834,789 | 7,337,537 |
| බලපත්‍ර ගාස්තු | 1,495,600 | 1,665,340 | 1,665,340 | -- | 1,875,000 | 1,717,457 | 1,717,457 | -- |
| වෙනත් ආදායම් | 26,302,000 | 22,457,837 | 3,240,603 | 48,075,703 | 16,500,000 | 15,740,689 | 9,145,408 | 28,858,469 |
| **එකතුව** | 37,810,150 | 32,511,831 | 13,901,064 | 56,363,443 | 23,987,000 | 22,990,348 | 15,688,222 | 37,752,676 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,516,613 ක් වූ අතර, රු.2,130,208 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.3,646,821 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.2,466,572 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,180,249 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2020 අප්‍රේල් මස 30 දිනට හිඟ ශේෂයෙන් රු.54,114 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.40,057 ක් වූ අතර, රු.15,535 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.55,592 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.8,920 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.46,672 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019/අ.ප්‍රා.ස/සභා යෝජනා /05.03.(i) සහා සම්මුතිය අනුව හිඟ අක්කර බදු දේපලවලට අදාළව රු.4,259 ක මුදලක් කපා හැරීමට සභාව තීරණය කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන අතර අක්කර බදු සම්බන්ධ ඉතිරි දේපලවලින් හිඟ මුදල් අයකිරීමට කටයුතු කරමි. |

## 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කඩ කුලී | | |
| ආරම්භක හිඟය රු.6,703,227 ක් වූ අතර, රු.2,901,125 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.9,604,352 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.2,983,693 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.6,620,659 ක් හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ කඩ කුලී ගෙවීම පැහැර හැර ඇති කඩ කාමර 10 ක් සඳහා සන්තකය පවරා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති අතර තවත් කඩකාමර 15 කට අදාළව සන්තකය පවරා ගැනීමේ කටයුතු සිදුකරමි. |

(ආ) බිම් බදු

| | | |
|---|---|---|
| ආරම්භක හිඟය රු.635,195 ක් වූ අතර, රු.421,616 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.1,056,811 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.616,651 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.440,160 ක් හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | සභාව සතු බිම් බදු ඒකක සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරනු ලැබූ සමීක්ෂණය අනුව බිම් බදු ලේඛනයේ සඳහන්ව ඇති බිම් බදු ඒකකයන් නැවත මැණුම් කර සැලසුම් සකස් කිරීම සඳහා කටයුතු කරමි. |

## 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.2,639,716 ක් හා මුද්දර ගාස්තු රු.44,508,569 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර හිඟ මුද්දර ගාස්තු වලින් රු.4,532,716 ක මුදලක් 2020 මැයි 31 දින දක්වා ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන කසලබදු අයකිරීම සඳහා තීරණය කර තිබුණද රෝහල්, කර්මාන්තශාලා, නිවාස සංකීර්ණ හා මංශ අලෙවිසැල්වලින් එක්රැස් කරන කසල ප්‍රමාණයන් සඳහා බදු මුදලක් අය කිරීමට 2020 ජනවාරි 31 දින වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | කසළ බැහැර කිරීමේ අංගනයේ කොම්පෝස්ට් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බැවින් 2021 වර්ෂයේ සිට කසළ බදු අය කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් වන කසල කිලෝග්‍රෑම් 5000ක පමණ ප්‍රමාණය නගර මධ්‍යයේ පිහිටි බෙනගාවගොඩ නමැති වගුරු බිමකට අවිධිමත් ලෙස බැහැර කර තිබුණි. | විධිමත් ලෙස කසල බැහැර කිරීම සිදුකළ යුතුවේ. | දෛනිකව එකතුවන කසළ 2020 මාර්තු 19 දින දක්වා බෙනගාවගොඩ නැමති වගුරු බිමට අවිධිමත් ලෙස බැහැර කළ නමුත් එදින සිට ඉදිකරන ලද කොම්පෝස්ට් අංගනයට කසල රැගෙන ගොස් කසළ ප්‍රතිචක්‍රීයකරණ කටයුතු ආරම්භ කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු බැකෝ රථය සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේදී ඇස්තමේන්තු සකස් කර නොතිබූ අතර මයිලෝමීටරය ආරම්භක සහ අවසාන අගය වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මීටර් පැය 880.4ක් සේවයේ යෙදවීම වෙනුවෙන් වැයකරන ලද රු 857,990.ක ඉන්ධන වියදම සනාථ කරගත නොහැකි විය. | ඇස්තමේන්තු සකසා විධිමත් පරිදි සංවර්ධන කටයුතු සඳහා යොදවා ගත යුතුවේ. | දෛනිකව යන්ත්‍ර යෙදවීමේදී ආරම්භක මයිලෝ මීටරය හා අවසාන මයිලෝ මීටරය අගය වගකිව යුතු නිලධාරියකු විසින් සහතික කර නොතිබූ අතර දෛනික සේවයේ යෙදවීමේදී සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සේවයේ යොදවා ඇත. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 49 හා 52 වගන්ති ප්‍රකාරව 2017 වර්ෂයේ සිට අනවසර ඉදිකිරීම් 61ක් වාර්තා වී තිබූ අතර, ඉන් 53ක් සම්බන්ධයෙන් නිවේදන පමණක් නිකුත් කර තිබුණද ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර නෛතික ක්‍රියාමාර්ගවලට එළැඹීම සඳහා තාක්ෂණ නිලධාරීන් දෙදෙනාට ලිඛිතව උපදෙස් ලබා දී ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 19 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 02 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර අනුමත කාර්ය මණ්ඩලය යටතේ ඇතුළත් කර නොමැති අතර 2020 ජුනි 01 දිනට ද්විතියික මට්ටමේ පුරප්පාඩු 01 ක් වී ඇත. ප්‍රාථමික සේවා ගණයේ සියලු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් තාවකාලිකව නවත්වන ලෙස දන්වා ඇත. |
| (ආ) බඳවාගෙන තිබූ සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන්ට රාජකාරී පැවරීමක් සිදු නොකිරීම, ආදේශක පදනම මත නැවත සේවකයින් බඳවා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු.4,631,912 ක අතිරේක වියදමක් දැරීමටත් සිදු වී තිබුණි. | තනතුරට අදාළ රාජකාරී පැවරිය යුතුවේ. | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 03 හා සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙක් බඳවා ගැනීම සිදු වූයේ එම ක්ෂේත්‍රවල රාජකාරි ඉටු කිරීමට දැනට සිටින කම්කරුවන් ප්‍රමාණවත් නොවන බැවින් හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බලධාරීන්ගෙන් අනුමැතිය ලැබී නොමැත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/අ/5/6 පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 05 වන වගන්තිය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 207 කට අදාළව ගිවිසුම් වර්ෂ 3කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | අකුරැස්ස ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 57ක් සඳහා ගිවිසුම් යාවත්කාලීනකර ඇති අතර, ගිවිසුම් යාවත්කාලින කිරීම සඳහා කටයුතු කරඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/අ/5/6 පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 151 ක මාසික කඩකුලිය වසර 5කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | පොදු වෙළෙඳ පොළ කඩකාමරවල පවතින ස්ථානීය දුර්වලතා හේතුවෙන් කුලිය වැඩිකිරීම අපහසු බැවින් තක්සේරු කටයුතු සිදු නොකළෙමි. |

**3.5 වත්කම් කළමණාකරණය**

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 22 කට අදාල ඔප්පුද ඉඩම් 24 කට අදාල පිඹුරුපත්ද නොතිබුණි. | ඉඩම් සඳහා ඔප්පු හා පිඹුරුපත් සකස් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඔප්පු හා පිඹුරුපත් නොමැති ඉඩම් සඳහා ඔප්පු හා පිඹුරුපත් සකස් කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | අනවසරයෙන් පරිහරණය කරමින් පැවති සභාව සතු අක්කර 02 පර්චස් 20.84 ක් වූ ඉඩම් 09 ක් සහ ප්‍රමාණය ලේඛනගත නොවූ ඉඩම් 02 ක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. | අනවසරයෙන් පරිහරණය කරන සභාව සතු ඉඩම් පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරමි. |